ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2020 මාර්තු 31 |

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් බිලියන 50ක සය-මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් ස්ථාපනය කිරීමට තීරණය කර, කොරෝනා ව්‍යසනය හෙවත් COVID–19 මගින් බලපෑමට පත් පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා සහය වීමට මූල්‍ය ආයතන වෙත උපදෙස් නිකුත් කරයි**

කොවිඩ්-19 මගින් බලපෑමට පත් පුද්ගලයන්, හා ව්‍යාපාර සඳහා ණය සහන කාලයක් (ප්‍රාග්ධනය හා පොළී සඳහා) සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය පහසුකම් ඇතුළු පුළුල් සහන සැපයීමේ අරමුණින් කැබිනට් මණ්ඩලය විසින් 2020.03.20 වැනි දින ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකමක් ස්ථාපනය කිරීමට තීරණය කර ඇත. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් (මූල්‍ය ආයතන) 2020.03.25 වැනි දින සිට ක්‍රියාත්මක මෙම ප්‍රතිමූල්‍ය පහසුකමට සහභාගීවීම සඳහා සුදුසුකම් ලබන අතර දැනුම් දී ඇති සහනයන් ලබා දෙනු ඇත. සහනයන් සහ ප්‍රතිමූල්‍ය පහසුකමේ ප්‍රධාන අංශ පහත පරිදි වේ.

1. **පොදු කොන්දේසි හා නියමයන්**

1.1 මෙම යෝජනාක්‍රමය යටතේ සහනයන් ලැබීමට සුදුසුකම් ලබන ව්‍යාපාර/ක්ෂේත්‍ර වනුයේ:

(අ) රුපියල් බිලියනයට අඩු පිරිවැටුම් සහිත නිෂ්පාදන, සේවා, කෘෂිකාර්මික (සැකැසුම් කර්මාන්ත ඇතුළුව), ඉදිකිරීම්, අගය එකතුකිරීම් හා අවසරලත් දේශීය ඖෂධ සැපයුම්කරුවන් ඇතුළු වෙළඳ ව්‍යාපාර වල නියුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්.

(ආ) කොවිඩ්-19 ව්‍යසනය යේ අනිටු ප්‍රතිඵලයන් නිසා බලපෑමට පත්;

- සංචාරක, සහ විදේශයන් හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් (lockdowns) නිසා අගතියට පත් ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිළි කර්මාන්ත හා මෙම ක්ෂේත්‍ර ආශ්‍රිත සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic service providers) ඇතුළු අපනයන ආශ්‍රිත ඍජු හා වක්‍ර ව්‍යාපාර;
- තම රැකියා හෝ ආදායම් අහිමි වූ ස්වයං-රැකියා ව්‍යාපාර හෝ පුද්ගලයන්;
- විදේශ මුදලින් ණය ගෙවීමට ඇති තම ආදායම හෝ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අහිතකර බලපෑම් එල්ලවූ විදේශ විනිමය උපයන්නන්.

1.2 කාලීන ණය, කල් බදු, උකස් ණය, අයිරා සහ රුපියල් හා විදේශ මුදලින් ලබාගත් වෙළඳ මූල්‍ය පහසුකම් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබනු ඇත. ආනයන පහසුකම් සඳහා ලබාදුන් ණය අතුරින් මෙම යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබන්නේ ඖෂධ, වෛද්‍යෝපකරණ, ආහාර, පොහොර, අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ ආනයනය සඳහා ලබාදුන් ණය පහසුකම් පමණි.

1.3 කොවිඩ්-19 ව්‍යසනයේ අහිතකර බලපෑමට ලක්ව ඇති සියළුම ගනුදෙනුකරුවන් හට මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ලබා ගැනීම සඳහා අදාළ මූල්‍ය ආයතන වෙතින් 2020.04.30 දිනට පෙර අන්තර්ජාලය ඔස්සේ හෝ වෙනත් ඕනෑම මාධ්‍යයක් හරහා

ඉල්ලීම් කල හැකි අතර, එකී ඉල්ලීම් සලකාබැලීම අවසන්වන තෙක් දැනට පවතින ණය පහසුකම් අය කර ගැනීම තාවකාලිකව අත්හිටුවිය යුතුය.

2. **ණය වාරික නියමිත පරිදි ගෙවූ 2020.03.25 දින වන විට පැවති ණය (සක්‍රිය ණය) සඳහා ලැබෙන සහන**

2.1 මෙම යෝජනා ක්‍රමය යටතේ 2020.04.30 වන දින හෝ ඊට ප්‍රථම ලිඛිතව සහන ඉල්ලා සිටින ණය ගැනුම් කරුවන්ගේ අදාල සියළු රුපියල් හා විදේශ මුදලින් ලබාගත් කාලීන ණය සඳහා මූල්‍ය ආයතන විසින්, ප්‍රාග්ධනය හා පොළී මුදල් යළි අයකරගැනීම පහත පරිදි කල් දැමීමට කටයුතු කල යුතුය.

(අ) සියළු ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන වෑන් රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා කුඩා රථ, බස් රථ, ස්වයං-රැකියා නියුක්තිකයන්/හිමිකරුවන් විසින් සේවයේ යෙදෙන යතුරුපැදි හා කුලී රථ වැනි අනෙකුත් වත්කම් සඳහා කල්බදු වාරික ගෙවීමට මාස හයක සහන කාලයක්.

(ආ) පෞද්ගලික අංශයේ විධායක නොවන සේවකයින් විසින් ලබා ගත් පුද්ගල ණය ගෙවීම සඳහා 2020.05.30 දක්වා සහන කාලයක්.

(ඇ) රුපියල් මිලියනයට අඩු මුළු වටිනාකමකින් යුතු සියළුම පුද්ගල ණය සහ කල්බදු වාරික සඳහා මාස තුනක සහන කාලයක්.

(ඈ) අගතියට පත් ව්‍යාපාරික අංශයන්ගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට, සංචාරක, ඇඟළුම්, වැවිළි, තොරතුරු තාක්ෂණ සහ සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic service providers) සඳහා මාස හයක සහන කාලයක්.

(ඉ) ඉහත 1.1 (අ) සහ (ආ) හි සඳහන් සියළුම සුදුසුකම් ලත් අනෙකුත් ව්‍යාපාර/ ක්ෂේත්‍ර සඳහා මාස හයක ණය සහන කාලයක්.

2.2 2020.03.25 දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන ස්ථාවර අයිරා පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කල යුතු වේ. සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන්ගේ, 2020.03.25 දිනට

කල් පිරෙන තාවකාලික අයිරා පහසුකම්වල කාලය මාස දෙකකින් දීර්ඝ කෙරෙනු ඇත. මෙම පහසුකම් සඳහා දීර්ඝ කරන ලද කාලසීමාව සඳහා අයකල හැකි උපරිම පොළී අනුපාතය 13% ක් වේ.

2.3 2020.03.25 දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන සුදුසුකම් ලත් වෙළඳ ණය පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කෙරේ.

2.4 2020.03.25 දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන උකස් ණය පහසුකම් ද 2020.09.30 දක්වා දීර්ඝ කෙරෙනු ඇත.

**3. ගෙවීම් හිඟහිටි 2020.03.25 දින වන විට පැවති ණය (අක්‍රිය ණය) සඳහා ලැබෙන සහන**

3.1 ගෙවීම් හිඟහිටි ණය සඳහා මූල්‍ය ආයතන විසින් 2020.03.25 දක්වා අයකරනු ලබන දඩ පොලිය අත්හැර දැමිය යුතු අතර, 2020.09.30 දක්වා ණය සහ අත්තිකාරම් අයකර ගැනීම කල් දැමිය යුතුය.

3.2 ණය ගැනුම්කරු විසින් 2020.03.25 දින වන විට ආපසු ගෙවන ලද මූලික ප්‍රාග්ධන ප්‍රතිශතය (එනම් 50% ට වැඩි හෝ 50% ට වඩා අඩු) මත පදනම්ව ණය හා අත්තිකාරම් නැවත සකස් කිරීම වෙනස් වන අතර සහ මෙම ප්‍රතිමූල්‍ය පහසුකම යටතේ අදාළ මූල්‍ය ආයතනය විසින් සලකා බලන දිනය දක්වා වන හිඟ පැවැති වාරික සඳහා අදාළ නොගෙවූ හා එකතු වූ පොළියෙන් ප්‍රතිශතයක් පසුව ගෙවීමට කල් තබනු ලැබේ. ගෙවිය යුතු ප්‍රාග්ධන ශේෂය යලි සකසා වසර තුනක් තුල දී ආපසු ගෙවිය යුතුය. එලෙස යලි සැකසූ ණය මුදල් ණය ගැනුම්කරු විසින් එකඟ වූ ආකාරයට ගෙවීමෙන් අනතුරුව මූල්‍ය ආයතනය මගින් කල් තබන ලද පොළී මුදල් ද අහෝසි කිරීමට කටයුතු කල යුතුය.

3.3 දෙපාර්ශවය අතර ඇතිකර ගත් නැවත ගෙවීම් ගිවිසුම් මත පදනම්ව මෙම යෝජනා ක්‍රමය යටතේ පිළිගෙන ඇති අක්‍රිය කාණ්ඩයේ සිටින ණය ගැනුම් කරුවන් සම්බන්ධයෙන්, ණය අයකර ගැනීම/නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සියළුම මූල්‍ය ආයතන විසින් අත්හිටුවිය යුතුය.

**4. නව කාරක ප්‍රාග්ධන හෝ ආයෝජන කටයුතු සඳහා ලබා දෙන ණය**

4.1 පිළිගත හැකි ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කිරීම සහ නිශ්චිත කොන්දේසි වලට අනුකූල වීමට යටත්ව සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් විසින් කාරක ප්‍රාග්ධන

හෝ ආයෝජන අරමුණු සඳහා රුපියල් වලින් සෑදුම්ලත්අතිරේක ණයක් හෝ නව ණය පහසුකමක් මූල්‍ය ආයතන වලින් ඉල්ලුම් කළ හැකි අතර, මෙම ණය දෙවර්ගයම අයකර ගැනීම 2020.03.25 සිට 2020.09.30 දක්වා කල් දමනු ලැබේ.

(අ) සුදුසුකම් ලබන සක්‍රිය හා අක්‍රිය කාණ්ඩයේ ගනුදෙනුකරුවන්ට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වසර දෙකක රුපියල් ණයක්, 4%ක වාර්ෂික පොළී අනුපාතිකයකට ලබා ගත හැක. එක් ගනුදෙනුකරුවෙකු හට එක් බැංකුවකින් රුපියල් මිලියන 25 සහ අනෙකුත් මූල්‍ය ආයතන සඳහා එක් ගනුදෙනුකරුවෙකුට එක් ආයතනයකින් රුපියල් මිලියන 10 හෝ මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය යන දෙකෙන් වැඩි අගය (මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව රුපියල් මිලියන 25 ඉක්මවන අවස්ථා වලදී පමණි) නොඉක්මවන වටිනාකමක රුපියල් ණය මුදලක් ලබා ගත හැක.

(ආ) සක්‍රිය ණය ගැනුම්කරුවන් හට පමණක්, ආයෝජන කටයුතු සඳහා සඳහා වසර පහක කාලසීමාවක් සඳහා, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය (AWPLR) + 1.5% කට සමාන උපරිම පොළී අනුපාතිකයකට යටත්ව තම ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කර ගැනීම සඳහා එක බැංකුවකින් එක ගනුදෙනුකරුවකු හට රුපියල් මිලියන 300කට නොවැඩි වටිනාකමක රුපියල් ණය මුදලක් ලබා ගත හැක.

5. **වෙනත් සහන**

5.1 මූල්‍ය ආයතන විසින් චෙක්පත් අගරුවීම්, ගෙවීම් නැවැත්වීම් සඳහා අයකිරීම්, සියළු ණය කාඩ්පත් හා අනෙකුත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම් 2020.09.30 දක්වා අත්හිට විය යුතුය

5.2 තවද, මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවන්ගේ අයදුම්පත් හුදෙක් අසතුටුදායක ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ (CRIB) වාර්තා මත පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වැලකියයුතු අතර මූල්‍ය ආයතන විසින් එවැනි අයදුම්පත් ඇගයීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස්කල යුතුය.

5.3 පවතින හදිසි තත්ත්වය සැලකිල්ලට ගනිමින්, බැංකු හට සිය ගනුදෙනුකරුවන්ට සහන සැපයීමට ඉඩකඩ සැලැස්වීමේ අරමුණින් මුදල් මණ්ඩලය විසින් සුවිශේෂී නියාමන ලිහිල්කිරීම් රැසක් හඳුන්වාදුන් අතර, එම නියාමන ලිහිල් කිරීම් අතරට

වෙනත් කිසිදු ණය සහනයක් නොලද ණය ගැනුම්කරුවන්හට සිය ණය සහ අත්තිකාරම් පියවීම සඳහා අමතර දින 60 ක සහන කාලයක් ලබාදීම ද ඇතුළත්ය.

පවතින දැඩි දුෂ්කරතා හමුවේ, ඉහත සඳහන් ණය සහනයන්ගෙන් තමාට අවශ්‍ය සහන ලබා ගැනීම සඳහා 2020.04.30 ට පෙර, තමන්ට අදාළ බැංකු ශාඛාවෙන් විමසන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවගෙන් ඉල්ලා සිටී. තවද බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මහ බැංකුව විමසිල්ලෙන් පසු වනු ඇත.

මේ සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලද 2020 අංක 5 දරණ චක්‍රලේඛය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙහි පහත සබැඳිය යටතේ පලකර ඇත. (https://www.cbsl.gov.lk/en/laws/directions-circulars-guidelines-for-banks)